07. 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි PL 3 - 2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු. **42,780 - 10 x 490- 11 x 540 -10 x 590 - 12 x630 – 66,540/-**ක් වන අතර එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයෙහි උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

08. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරින්ට රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට නිලධාරියා යටත් විය යුතුය.

09. **සම්මුඛ පරීක්ෂණය**

ඉහත සඳහන් අකාරයට නිවැරදි අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන් වෘත්තිය පරීක්ෂණය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි.

සම්මුඛ පරීක්ෂණය ආකාර 02 කි.

(අ) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - අයදුම්කරුවන් පත්වීමක් ලැබීම සඳහා නිවේදනයේ 02 වගන්ති අනුව සුදුසුකම් සපුරා තිබේද යන්න මෙහිදි පරීක්ෂා කරනු ලැබේ. මෙහිදි ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ.

(ආ) වෘත්තිය පරීක්ෂණය - වෘත්තිය පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් ලබා දෙන අතර, ඉන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 50 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත යුතුවේ. මෙහිදි මහාමාර්ග නීති පිළිබඳ දැනුම සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම ප්‍රායෝගිකව භාවිතය ද ඇතුළත්ව රිය පැදවීමේ නිපුණත්වය පරීක්ෂා කරනු ලබයි.

වෘත්තිය පරීක්ෂණයේදි පහත සඳහන් නිර්ණායකයන් සඳහා ලකුණු දෙනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

සාමාන්‍ය හා වෘත්තිය පරීක්ෂණය සමත් අයදුම්කරුවන් සඳහා පමණක් පත්වීමක් සඳහා තෝරාගනු ලැබේ.

10. පත්වීමක් සඳහා තෝරා ගැනීම

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු සේවයේ ඇති පුරප්පාඩු ගණනට අදාලව සාමාන්‍ය හා වෘත්තිය පරීක්ෂණ සඳහා කැඳවා එමගින් සමත් වන අයදුම්කරුවන් ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ රියදුරු III ශ්‍රේණියේ පත්වීමක් සඳහා තෝරාගනු ඇත.

11. **සාවද්‍ය තොරතුරු සැපයීමට දඩුවම්**

I. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුය. මෙම බඳවා ගැනීමට අදාල රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් සම්මුඛ හා වෘත්තිය පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ හා වෘත්තිය පරීක්ෂණය පැවැත්වෙන අතර හෝ ඊට පසුව හෝ කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් ඔහු/ඇය විසින් හිතා මතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙලි වූවහොත් හෝ ඔහුට තවදුරටත් පත්වීමක්

